# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,511 - 2026 ඔක්තෝබර් මස 16 සිකුරාදා - 2026.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | - |


*සැ.යු.:* (i) ප්‍රජා පාදක විශෝධන (සංශෝධන) පනත් කෙටුම්පත 2026.10.09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) භාර (සංශෝධන) පනත් කෙටුම්පත 2026.10.09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 නොවැම්බර් මස 06 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ඔක්තෝබර් මස 23 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


0000 - B 82839 - (2026/10)
E - 01

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඊ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

*සැ. යු.* : "මින් පෙර පළ වූ *ගැසට්* නිවේදන සියල්ලෙහිම සඳහන්, විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස් යන මැයෙන් පළ කරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම *ගැසට්* නිවේදනයේ සිට ඉදිරියේ දී නිකුත් කරන *ගැසට්* නිවේදනයන්හි පළ කරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. ඃ

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් කැඳවනු ලැබේ.

### 1. ප්‍රාථමික (ශිල්පීය)- රියදුරු -පුරප්පාඩු 02

***සුදුසුකම් :***

**බාහිර අයදුම්කරුවන් :**

*අධ්‍යාපන :*

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත්ව තිබීම;

*සහ*

බරවාහන සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ බලපත්‍රය ලබා තිබීම. බරවාහන බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවුරුදු 03 ක පළපුරුද්ද ලබා තිබීම (සහතික ඉදිරිපත් කළ යුතු වේ)

***අභ්‍යන්තර අයදුම්කරුවන් :***

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීමෙන් පසු රිය පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම;

*සහ*

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ශ්‍රේණියක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

***වැටුප් පරිමාණය :***

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය.

රුපියල් 43,280 - 10 X 490 – 10 X 540 – 10 X 590 – 12 X 630 – රු. 67,040/- (PL 3 – 2025)

ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප ගෙවනු ලැබේ.

***වයස් සීමාව:***

අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සෑම අයදුම්කරුවෙක් ම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
III. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

***අනෙකුත් දීමනා :***

ජීවන වියදම් දීමනාව සහ රජයෙන් අනුමත අනෙකුත් දීමනා

***බඳවා ගැනීමේ ක්‍රමය :***

ඉහත සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් අතුරෙන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ.

***සේවා කොන්දේසි :***

මෙම තනතුර ස්ථිරය. වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ. සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා හිමිකම් ඇත. සේවකයා තම වැටුපෙන් 8% ක ප්‍රමාණයකින් හා සේවා යෝජකයා 12% ක ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක වේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ප්‍රමාණයක් සේවා යෝජකයා ගෙවනු ලබයි.

*අයදුම් කිරීමේ අනුපිළිවෙළ :*

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වෙබ් අඩවියේ https://judgesinstitute.lk/ පළකර ඇති ආදර්ශ අයදුම්පත අදාළ සහතික පත්‍රවල සහතික කරන ලද ඡායා පිටපත් සමග නිසි පරිදි සම්පූර්ණ කර **2026.10.31** වැනි දිනට හෝ එදිනට පෙර ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් යොමුකළ යුතු ය. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතු වේ. අයදුම්පත් ලියාපදිංචි තැපෑලට යොමු කරන දිනය නොව ආයතනයට ලැබෙන දිනය, වලංගු දිනය බවට සැළකීමේ අයිතිය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සතුව පවතී.

එමෙන්ම අයදුම්පත් ලියාපදිංචි තැපැල මගින් යොමු කිරීමට අමතරව https://judgesinstitute.lk/ වෙබ් අඩවියේ අයදුම්කරන තනතුරට අදාළ සබැඳිය ඔස්සේ පවතින ගූගල් පෝරමය සම්පූර්ණ කර යොමු කළ යුතු ය.

රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් එවීමට කටයුතු කළ යුතු වේ. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද, තැපෑලේ දී නැති වූ බවට ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

අධ්‍යක්‍ෂ,
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,
අංක 80 (5 වන හා 6 වන මහල),
අධිකරණ මාවත,
කොළඹ 12.

**ආදර්ශ අයදුම්පත**

**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය**

**රියදුරු තනතුර සඳහා අයදුම්පත (ප්‍රාථමික - ශිල්පීය)**

(ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ “රියදුරු තනතුර සඳහා අයදුම්පත” ලෙස සඳහන් කරන්න)

**1. පෞද්ගලික තොරතුරු:**

1.1 සම්පූර්ණ නම (සිංහලෙන්) : ..........................................................................................

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................

1.3 මුලකුරු සමග නම (සිංහලෙන්) : ..........................................................................................

1.4 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................

1.5 ස්ථිර ලිපිනය : ..........................................................................................

1.6 ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

1.7 දුරකථන අංකය : ..........................................................................................

1.8 විද්‍යුත් තැපැල (E-mail) : ..........................................................................................

1.9 උපන් දිනය : අවුරුද්ද : ............ මාසය: ............... දිනය: ......................................

1.10 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු : ............ මාස: ……............ දින: ..............................................

1.11 ස්ත්‍රී / පුරුෂ භාවය : ..........................................................................................

1.12 විවාහක / අවිවාහක බව : ..........................................................................................

**2. අධ්‍යාපනික සුදුසුකම්:**

(අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. සහතික පත්‍රවල සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

2.1 ප්‍රථම වාරය:

විභාග වර්ෂය: .......................... විභාග අංකය: ..........................

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |

2.2 දෙවන වාරය (අදාළ වේ නම් පමණක්):

විභාග වර්ෂය: .......................... විභාග අංකය: ..........................

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |

**3. රියදුරු බලපත්‍රය පිළිබඳ තොරතුරු:**

3.1 රියදුරු බලපත්‍ර අංකය : ..................................................

3.2 බලපත්‍රය නිකුත් කළ දිනය : ..................................................

3.3 බලපත්‍රය වලංගු අවසන් දිනය : ..................................................

3.4 බලපත්‍ර වර්ගය (බර වාහන / සැහැල්ලු වාහන) : ..................................................

**4. පළපුරුද්ද පිළිබඳ තොරතුරු:**

(බාහිර අයදුම්කරුවන් සඳහා බර වාහන බලපත්‍රය ලැබීමෙන් පසු අවුරුදු 03 ක පළපුරුද්ද / අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා රිය පැදවීමේ වසර 03 ක පළපුරුද්ද, සේවය සනාථ කිරීමේ සහතික පත්‍රවල සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

| *ආයතනයේ නම* | *තනතුර* | *සිට (දිනය)* | *දක්වා (දිනය)* | *සේවා කාලය (වසර/මාස)* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

**5. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා පමණක්:**

(ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ගණයේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය සඳහා)

5.1 වත්මන් තනතුර : ..................................................

5.2 සේවා ගණය (PL-1 / PL-2) : ..................................................

5.3 වත්මන් තනතුරට පත්වූ දිනය : ..................................................

5.4 සම්පූර්ණ කළ සේවා කාලය : ..................................................

**6. චරිත සහතික ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු:**

1. නම : ..................................................
   තනතුර හා ලිපිනය : ..................................................
   දුරකථන අංකය : ..................................................

2. නම : ..................................................
   තනතුර හා ලිපිනය : ..................................................
   දුරකථන අංකය : ..................................................

**7. අයදුම්කරුගේ ප්‍රකාශය:**

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද සියලුම තොරතුරු මා දන්නා හා විශ්වාස කරන පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. ලබා දී ඇති තොරතුරුවල කිසියම් අසත්‍ය, වැරදි හෝ නොමග යවන තොරතුරක් අනාවරණය වුවහොත්, මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හෝ සේවයට බඳවාගෙන ඇති අවස්ථාවකදී සේවය අවසන් කිරීමට ආයතනයට ඇති අයිතිය පිළිගනිමි.

දිනය: ................................. අයදුම්කරුගේ අත්සන : ..........................................................

**8. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය:**

(දැනට රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් සඳහා පමණි)
මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................... මහතා / මෙනෙවිය / මහත්මිය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ............................................................... තනතුරේ සේවය කරන අතර, ඔහු / ඇය ඉහත තනතුර සඳහා තේරී පත්වුවහොත් සේවයෙන් මුදා හැරීමට හැකි / නොහැකි බව සහතික කරමි.

................................. (දිනය)

..................................................................., (ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව).

10 - 630

---

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය දීර්ඝ කිරීම

**ගොවිජන සමාලෝචන මණ්ඩල පිහිටුවීමට අවශ්‍ය සමාලෝචන මණ්ඩල සාමාජිකයින් (මූල මණ්ඩලයක්) පත් කර ගැනීම**

අංක 2497 දරන 2026.07.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (IIඅ) වැනි කොටසෙහි පළ කරන ලද "ගොවිජන සමාලෝචන මණ්ඩල පිහිටුවීමට අවශ්‍ය සමාලෝචන මණ්ඩල සාමාජිකයින් (මූල මණ්ඩලයක්) පත් කර ගැනීම" සඳහා වන නිවේදනයේ දක්වා ඇති අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය සම්බන්ධයෙන් වන වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

"සියලුම අයදුම්පත් **2026** නොවැම්බර් මස **10** වැනි දින හෝ ඊට **පෙර** අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යලය වෙත එවිය යුතු ය."

තව ද, 2026.07.10 දිනැති මුල් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර, මෙම තනතුර සඳහා දැනටමත් අයදුම් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි.

**ප්‍රසන්න අල්විස්,**
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

10 - 631

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

### විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ, විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇතිවී තිබෙන පුරප්පාඩු පිරවීම සඳහා මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ(1)(අ) ව්‍යවස්ථාව යටතේ, නියෝජ්‍ය විගණකාධිපති ධුරය හෝ ඊට ඉහළින් වූ ධුරයක් දරන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම" යටතේ ප්‍රවේශ විය හැකි "විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම" නමින් පළකර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2026 ඔක්තෝබර් 30 දින හෝ එදිනට පෙර,**

> **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,**
> **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
> **ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
> **ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කරනු ලැබිය යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ/ විද්‍යුත් ලිපියෙහි විෂයය වශයෙන් 'විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,

2026 ඔක්තෝබර් මස 15 වැනි දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

10 - 632

## සංශෝධනය කිරීමයි

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ශිෂ්‍ය නිලධාරි පුරප්පාඩු - ඉදුරාම බඳවා ගැනීම්

වර්ෂ 2026 ක් වූ ජුනි මස 19 වන දින අංක 2494 දරන *ගැසට්* පත්‍රයේ I වන කොටසේ (IIඅ) වන ඡේදයේ පළ කරන ලද වෛද්‍ය, නීති ශාඛාව සඳහා පවතින පුරප්පාඩු පහත පරිදි සංශෝධනය වන අතර අනෙකුත් සුදුසුකම් සහ විස්තරයන් වෙනස් නොවන බව දන්වා සිටිමි.

**ඇතුළත් කිරීම :**

**වෛද්‍ය ශාඛාව**

**නිර්වින්දන විශේෂඥ වෛද්‍ය - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වෙච්ඡා)**

(*අ*) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (**SLMC**) විසින් පිළිගනු ලබන **MBBS** උපාධියක් හෝ ඊට සමාන වෛද්‍ය සුදුසුකමක් සතු විය යුතු ය.

(*ආ*) ශ්‍රී ලංකාවේ අදාළ ව්‍යවස්ථාපිත බලධාරියා විසින් පිළිගනු ලබන නිර්වින්දන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකමක්, එනම් **MD in Anesthesiology** හෝ ඊට සමාන සුදුසුකමක් සතු විය යුතු ය.

(*ඇ*) නිර්වින්දන විද්‍යාව පිළිබඳ අවශ්‍ය පශ්චාත් උපාධි පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතු අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය (**PGIM**) හෝ අදාළ ව්‍යවස්ථාපිත බලධාරියා විසින් පිළිගනු ලබන විශේෂඥ/උපදේශක වෛද්‍ය තත්ත්වය සතු විය යුතු ය.

(*ඈ*) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (**SLMC**) ලියාපදිංචි වී සිටිය යුතු අතර, ශ්‍රී ලංකාවේ වෛද්‍යවරයෙකු සහ විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස වෛද්‍ය සේවයේ නිරත වීමට සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

**ඇතුළත් කිරීම**

**නීති ශාඛාව**

**නීති නිලධාරී - පිරිමි / කාන්තා (නිත්‍ය / ස්වේච්ඡා)** ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම; සහ

(*අ*) නීතිඥවරයෙකු ලෙස මහේස්ත්‍රාත් අධිකරණයේ, දිසා අධිකරණයේ, මහාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණය තුළ නඩු කටයුතු මෙහෙයවා තිබීම.

(*ආ*) සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් වාණිජ ගිවිසුම් සැකසීම පිළිබඳ පළපුරුද්ද, නොතාරිස් කටයුතු පිළිබඳ ලේඛන සැකසීම.

(*ඇ*) සමාගම් ලේකම් කටයුතු පිළිබඳ පලපුරුද්ද තිබිය යුතු ය.

හමුදාපති,
එයාර් මාර්ෂල් වී. බී. එදිරිසිංහ,

ගුවන් හමුදාපති,
ඩබ්ලිව්ඩබ්ලිව්පී, ආර්ඩබ්ලිව්පී, ආර්එන්පී, (සිව්වරක්) යූඑන්පී,
එෆ්එන්ඩියූ (චීනය) පීඑස්සී, කිව්එච්අයි

ගුවන් හමුදා මූලස්ථානය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
තැ.පෙ. 594
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

10 - 634/1

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාව ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව පුරප්පාඩු පවතින අතර ඒ සඳහා අවම සහ විශේෂ සුදුසුකම් පහත දක්වා ඇත.

**මූලික අධ්‍යාපන සුදුසුකම් :**

2. සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

**වෘත්තිය සහ අදාළ අධ්‍යාපන හා විශේෂිත සුදුසුකම් :**

3. එක් එක් වෘත්තීන් සහ ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් පරිදි වේ.

(*අ.*) වෛද්‍ය වෘත්තීන්

(1) හෙද සහයක (කාන්තා) - නිත්‍ය/ස්වේච්ඡා

සිංහල / දෙමළ, ගණිතය/විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Person Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ගණිතය හෝ සියලු විද්‍යා විෂයයන් : භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) සහ වෙනත් එක් විෂයක් සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා ගත යුතු ය.

අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විද්‍යා / ගණිත/ කෘෂි විද්‍යා විෂය ධාරාවන්ගෙන් හදාරා සමත්ව තිබීම අමතර සුදුසුකමක් වන අතර එය අනාගතයේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තිය පුහුණු පාඨමාලාවන් හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

(*ආ.*) මෙහෙයුම් වෘත්තීන්

(1) සුනඛ පාලක (කාන්තා) - නිත්‍ය/ස්වේච්ඡා

සිංහල /දෙමළ භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Person Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව ඉදුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී**

4. අවශ්‍ය අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් :

(අ.) සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන්

(1) රථවාහන කාර්මික ශිල්පී (පිරිමි) - ස්වේච්ඡා (නිල ඇඳුම් නොවන)

සිංහල / දෙමළ විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ඇතුලුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Person Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

රජයේ ආයතනයක හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක මෝටර් රථ කාර්මික ශිල්පය (මෝටර් රථ විදුලි කාර්මික ශිල්පය, මෝටර් රථ විද්‍යුත් කාර්මික ශිල්පය, මෝටර් රථ වායුසමීකරණ ශිල්පය) පිළිබඳව ජාතික වෘත්තිය නිපුනතා අදියර II : NVQ Level II) හෝ ඊට වැඩි සුදුසුකම් ලබා තිබීම;

*සහ*

අවම වශයෙන් අවුරුදු 01ක මෝටර් රථ කාර්මික (මෝටර් රථ විදුලි කාර්මික ශිල්පය, මෝටර් රථ විද්‍යුත් කාර්මික ශිල්පය, මෝටර් රථ වායුසමීකරණ ශිල්පය) පලපුරුද්ද ලබා තිබීම.

(ආ.) වෛද්‍ය වෘත්තීන්

(1) හෙද සහයක (කාන්තා) - ස්වේච්ඡා

සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Person Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි, ගණිතය හෝ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සාමාන්‍ය සාමාර්ථයන් ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ඇතුලුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත් ව තිබිය යුතු ය.

රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතනයකින් සායනික පුහුණුව ඇතුළුව වසරකට නොඅඩු කාලයක් හෙද පුහුණුව ලබා තිබිය යුතු අතර එම සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකපත් ලබා තිබිය යුතු ය. *නැතහොත්* NVQ Level III හෝ ඊට වැඩි හෙද සහකාර සහතිකයක් තිබිය යුතු ය.

5. විශේෂ සටහන :

(අ.) Person Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී සිංහල හෝ දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් නොමැති අපේක්ෂකයින් බඳවාගත් දින සිට වසර පහක් ඇතුළත සිංහල හෝ දෙමළ භාෂාව සඳහා අවශ්‍ය සාමාර්ථය ලබා ගත යුතු ය.

(ආ.) ඉදුරාම බඳවාගනු ලබන අපේක්ෂකයින්ගේ අ.පො.ස (සා.පෙළ) වෙනුවට ජාතික වෘත්තීය සුදුසුකම් අදියර III (NVQ III) හෝ ඊට වැඩි සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ පළමු මට්ටම (SLQF 1) හෝ ඊට වැඩි සහ අ.පො.ස (උ.පෙළ) වෙනුවට ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ IV) හෝ ඊට වැඩි සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගොපදේශයේ දෙවන මට්ටම (SLQF 2) හෝ ඊට වැඩි සහතිකයන් ලබා සිටීම සලකා බලනු ලැබේ.

6. අනෙකුත් සුදුසුකම් :

(අ.) ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි.

(1) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි

(2) වයස : 2026 අගෝස්තු මස 01 වන දිනට - පළමු කාණ්ඩය
: 2026 දෙසැම්බර් මස 01 වන දිනට - දෙවන කාණ්ඩය

<u>නිත්‍ය</u>
කාන්තා - අවුරුදු 18ත් 22ත් අතර

<u>ස්වේච්ඡා</u>
කාන්තා - අවුරුදු 18ත් 26ත් අතර

<u>ඉඳුරාම බඳවාගැනීම් (ස්වේච්ඡා)</u>
පිරිමි - අවුරුදු 18ත් 30ත් අතර
කාන්තා - අවුරුදු 18ත් 26ත් අතර

(3) උස : අඩි 5 අඟල් 3 ට (159 cm) නොඅඩු විය යුතුයි (පිරිමි)
: අඩි 5 අඟල් 1 ට (154 cm) නොඅඩු විය යුතුයි (කාන්තා)

(4) බර : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි)
: 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

ශරීර ස්කන්ධ දර්ශකය = බර (කි.ග්‍රෑ.) / උස (මී.)

(5) වර්ණ දෘෂ්ටිය : $CP_2$

(6) පෙනීම : 6/9 එක් ඇසක්, ඉතිරි ඇස 6/6 සහ දුරදක්න දෘශ්‍ය තීව්‍රතාවය 6/6 නොමැතිව (උපැස් හා කාච රහිතව)

(7) පපුව : අඟල් 32ට නොඅඩු විය යුතුය (පිරිමි)

(8) සිවිල් තත්වය : නිත්‍ය - අවිවාහක
ස්වේච්ඡා/ඉඳුරාම බඳවා ගැනීම් - විවාහක/අවිවාහක

(අ) නිත්‍ය ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතු අතර ගුවන් හමුදාවට බැඳී වසර හතරක් (04) ගතවන තුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවන තුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් භටයින්ට / ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.

(ආ) අවිවාහක වයස අවුරුදු 25 ට වැඩි බඳවා ගන්නා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් හට ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවන තුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවන තුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.

(ඇ) අවිවාහක ඉඳුරාම බඳවා ගන්නා ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් (නිත්‍ය / ස්වේච්ඡා) හට ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවීමෙන් පසු විවාහ වීමට අවසර දෙනු ලැබේ.

7. තුන්වන සහ හතරවන ඡේදයන් හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ හයවන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා නොමැති අපේක්ෂකයින් / අපේක්ෂිකාවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ

පරීක්ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්‍ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිණුම්වලට අනුව උස, බර, පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන් / අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

8. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

9. සේවා කොන්දේසි :

(අ) අපේක්‍ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය / ස්වේච්ඡා සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති වෘත්තිය අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තිය පුහුණුව නිමවීමෙන් පසු ඔහු / ඇය අදාළ වෘත්තියේ ගුවන්භටයෙකු / ගුවන් කාන්තාවක ලෙස සේවයෙහි පිහිටුවනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුය.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතු යි.

(ඈ) සෑම ආධුනිකයෙකුටම සියළුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

(ඊ) පුහුණුවන කාලසීමාව තුළදී යම් ආධුනිකයෙකුහට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(උ.) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු / ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත ගුවන් හමුදා සේවයෙන් මුදාහැරීමට වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු / ඇය වෙනුවෙන් දරා ඇති සියළුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාපති සමඟ බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ඌ) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 32 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමඟ මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

(එ) පළමුවන ඡේදයේ සිට හයවන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම වෘත්තීන්ට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දැක් වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක ගුවන් භටයින් / ගුවන් කාන්තාවන්, ගුවන්භට / ගුවන් කාන්තා නිවස්නයන් හි සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අවිවාහක ගුවන් භටයින්ගේ ආහාර දීමනා ගුවන්භට භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා විවාහක නිවස්නයන්හි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

(ඕ) සියළුම ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් රාජකාරී හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක.) සියලුම ගුවන් හටයින් / ගුවන් කාන්තාවන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

10. බඳවා ගැනීමේ කොන්දේසි :

(අ.) *නිත්‍ය ගුවන් හටයින් හා ගුවන් කාන්තාවන් සඳහා :* තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් හට / ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතු ය. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතු යි. වසර 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත සේවය දීර්ඝ කිරීමට සුදුසු ගුවන්හටයින්ට / ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

(ආ.) *ස්වේච්ඡා ගුවන් හට/ ගුවන් කාන්තාවන් සඳහා :* තෝරාගනු ලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් හට/ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 05 ක සේවා කාලයකට යටත් විය යුතුයි. වසර 05 ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා සුදුසු ගුවන් හට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

(ඇ.) *රථවාහන කාර්මික ශිල්පී :* (නිල ඇඳුම් රහිත) සඳහා : තෝරාගනු ලබන අපේක්ෂකයන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් හට/ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 02 ක සේවා කාලයකට යටත් විය යුතු යි. වසර 02 ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා සුදුසු ගුවන් හට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

11. රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් : තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා රෙගුලාසි පිළිපැදිය යුතු වේ.

12. වැටුප් හා දීමනා :

(අ.) නව මූලික වැටුප් සංශෝධනය අනුව ගුවන් හට/ ගුවන් කාන්තාවන්ට අදාළ මූලික වැටුප සහ දීමනා ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *නිලය* | *මූලික වැටුප (රු.)* | *අනෙකුත් දීමනා (රු.)* | *අඩු කිරීම් රහිතව සම්පූර්ණ වැටුප (රු.)* |
|---|---|---|---|
| ගුවන්හට | 46,922.00 | 22,150.00 | 69,072.00 |
| නායක ගුවන්හට | 48,290.00 | 22,150.00 | 70,440.00 |
| කෝප්‍රල් | 49,658.00 | 22,150.00 | 71,808.00 |

*සැලකිය යුතුයි :* පිටත වාසය කරන ගුවන් හටයින් /ගුවන් කාන්තාවන් හට මසකට රු. 30,000.00ක පමණ ආහාර දීමනා සහ අදාළ පරිදි ගෙවල් කුලී දීමනාව ගෙවනු ලැබේ.

(ආ.) *විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා* : වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන්හටයින් / ගුවන් කාන්තාවන් දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව සිදු කරනු ලැබේ.

13. ඉල්ලුම්කරුට / ඉල්ලුම්කාරියට උපදෙස් :

(අ.) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතු යි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු යි. ඉල්ලුම්පත් 2026 ඔක්තෝබර් මස 31 වන දින දහවල් 12.00 ට පෙර ලැබෙනසේ "ආධුනිකයින් බඳවා ගැනීමේ ප්‍රධාන නිලධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ. යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු යි (ලියාපදිංචි තැපැලෙන් එවනු නොලබන අයදුම්පත් බාරගනු නොලැබේ) අයදුම්පතේ ඉහළ වම් කෙලවරේ "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හටයින් / ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු යි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කළයුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල වෙත ලැබුනාවූද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නාවූද ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

(ආ.) රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය

ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු යි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද ඒ සමඟ තිබිය යුතු යි.

(ඇ.) අයදුම්කරුවන් සඳහා අයදුම්පත්‍ර www.airforce.lk/joinus/apply යන වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ඈ.) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙනවිට අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සහ සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු යි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ).

(2) ජාතික හැඳුනුම්පත.

(3) අයදුම්කර ඇති වෘත්තීයට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල්පිටපත් (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ සහතික හෝ පාසලෙන් ලබාගත් සහතිකයක් නම් නිලමුද්‍රාව සඳහන්ව තිබිය යුතු ය).

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(5) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (මාස 06කට නොඅඩු කාලයකින්). ඉන් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙක් අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතු ය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත් හා ඡායාපිටපත බැගින්.

(7) මාස හයක් (6) ඇතුලත ලබාගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකයක්.

(8) පාසල් හැරයාමේ සහතිකය.

(9) කාඩ් බෝඩ් ෆයිල් කවරයක් සහ ෆයිල් ලේස් එකක්,

(10) ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද අඟල් 2 x 2 1/2 උඩුකය වර්ණ ඡායා රූපයක්.

(ඉ.) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සලකා බලනු නොලැබේ.

(ඊ.) වෙනත් ලියකියවිලි හෝ සහතික පත්වල මුල් පිටපත් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(උ.) අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා, ඒවා අස්ථානගත වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

(ඌ.) අයදුම්පත්‍රවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් උස, වයස, පපුවෙහි වට ප්‍රමාණය වැනි මූලික අවශ්‍යතාවයන්වල දත්ත මත පදනම්ව මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවන අතර අයදුම්පත්‍රවල සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්කරුවන් මූලික පරීක්ෂාවන්වල දී ඉවත් කරනු ලැබේ.

14. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්හට ගුවන් හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

15. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් / අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු යි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතු යි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

16. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ගුවන් හමුදා ප්‍රමිතියට අනුකූලව වෛද්‍ය පරීක්ෂණයට හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතුයි.

17. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන් / අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණු අනුව ය.

18. අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහු/ ඇය ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙන් පමණි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙලඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතුවන්නේය.

19. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට / අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

(වීබී එදිරිසිංහ)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්),
යූඑස්පී, එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී, කිව්එච්අයි,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාපති.

ගුවන් හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
තැ.පෙ. 594,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|

**ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා ගුවන් හමුදාවේ ආධුනික ගුවන් භට/ ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත**
**ගුවන් හමුදාවේ................................................................................... වෘත්තීය**

1. පුරවැසිභාවය : ..........................................................................................................................................
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) : .........................................................................................
..........................................................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................................................................

4. ස්ථිර ලිපිනය : .........................................................................................................................................

5. තැපැල් ලිපිනය : ......................................................................................................................................

6. උපන් දිනය : ...................................................................

වයස : (පළමු කණ්ඩායම - 2026 අගෝස්තු මස 01 දිනට / දෙවන කණ්ඩායම -2026 දෙසැම්බර් මස 01 දිනට )

| ඉල්ලුම්කරන කණ්ඩායම | පළමු කණ්ඩායම -2026 / දෙවන කණ්ඩායම -2026 |
|---|---|
| වයස | අවුරුදු : ............. මාස : ............. දින : ............. |

7. උස : සෙන්ටිමීටර්....................(අඩි......... අඟල් ...........)

8. පපුව : අඟල් ..................... (පිරිමි)

9. බර : කිලෝග්‍රෑම් .....................

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය : ..........................................................................................

11. ස්ථිර ලිපිනයට ආසන්න ගුවන් හමුදා කඳවුර : ..........................................................................................

12. දිස්ත්‍රික්කය : ..........................................................................

13. ඡන්ද කොට්ඨාසය : ..................................................................

14. ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ අංකය : ..........................................................................................

15. දුරකථන අංකය : .................................................... WhatsApp අංක : ..........................................................................
විද්‍යුත් ලිපිනය: ..................................................................................

16. විවාහක හෝ අවිවාහක බව : ..................................................................

17. ස්ත්‍රී / පුරුෂ භාවය : ..................................................................

18. අධ්‍යාපනය ලැබූ පාසල් : ප්‍රාථමික ..........................................................................................
ද්විතීක ..........................................................................................

19. පාසල් සහ/ හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :-

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව)* | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | අ.පො.ස. (උ.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | විශ්වවිද්‍යාල/වෙනත් සුදුසුකම් | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් : ..........................................................................................

21. පාසලෙන් /විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

22. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | වර්තමාන ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| පියා : | | | | |
| මව : | | | | |
| සහෝදර සහෝදරියන්ගේ : | | | | |
| | | | | |
| | | | | |

23. ඔබගේ ලේ ඥාතීන් කවරෙකු හෝ මින් පෙර සන්නද්ධ සේවයේ නියුතුව සිටියේ නම් ඒ පිළිබඳව විස්තර :
(දැනට සේවයෙන් නියුතු නම්, ඒ පිළිබඳවත්, සේවයෙන් ඉවත්ව ගොස් ඇත්නම් ඉවත් වූ ආකාරය සඳහන් කරන්න, නීතිමය ගැටළු ද ඇතුළත්ව සඳහන් කරන්න)

| නිළය | නම | ශාඛාව/වෘත්තිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| | | | |
| | | | |

24. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර :- (ඔබ සහභාගි වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා) :

| අනු. අංක | විස්තරය | පාසල් | පළාත් | ජාතික | අන්තර්ජාතික |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

25. පාසලේ දී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධාන වලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න.) :
..........................................................................................................................................

26. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :
..........................................................................................................................................

27. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම්කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න : .............................................
..........................................................................................................................................

28. සිවිල් හෝ යුධ අධිකරණයකදී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න :
..........................................................................................................................................

29. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක / සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුලුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :
..........................................................................................................................................

30. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |
| | | |

31. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්භට/ගුවන්කාන්තාවන් සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා එයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

දිනය : ........................................ .................................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

32. ඉල්ලුම්කරුගේ මව / පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(*අ.*) ඉහත අයදුම්පතේ 31 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ........................................................................................................ නැමැති අපේක්ෂකයාගේ මව / පියා / භාරකරු මම වෙමි.

(*ආ.*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි :-

(1) පුහුණුව ලබන කාලසීමාව තුළ දී ඉහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම;

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම / ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු / ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

..................................................................,
දෙමාපිය / භාරකරුගේ අත්සන.

දිනය : ...............................................
නම : .................................................................................................................................................
*(පැහැදිලි අකුරෙන්)*

ලිපිනය : ...........................................................................................................................................

..................................................................,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය : .............................................

නම : .................................................................................................................................................
*(පැහැදිලි අකුරෙන්)*

ලිපිනය : ..........................................................................................................................................

..................................................................,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය : .............................................

නම : .................................................................................................................................................
*(පැහැදිලි අකුරෙන්)*

ලිපිනය : ..........................................................................................................................................

10 - 634/2

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ III වන ශ්‍රේණියේ රසායනාගාර සහායක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත / සීමිත සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම - 2026

ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ III වන ශ්‍රේණියේ රසායනාගාර සහායක තනතුරෙහි පවත්නා පුරප්පාඩු 20ක් සඳහා පත් කිරීමට සුදුස්සන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන්, රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරි කමිටුවේ අංක PMO/RRPCM/2025/decision හා 2025.11.12 දිනැති අනුමැතිය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විවෘත අයදුම්කරුවන් විසින් සෘජුවම ද, සීමිත අයදුම්කරුවන් විසින් ස්වකීය අංශ ප්‍රධානියා මගින් ද සහතික කරගෙන "අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය" යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රසායනාගාර සහායක තනතුර**" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

සීමිත අයදුම්කරුවන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන තනතුරක යටත් පිරිසෙයින් අවුරුදු පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තනතුරේ ස්ථිර කර තිබිය යුතු අතර, තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

**අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.11.13 දින වේ.**

*සටහන :* **ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳව සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර යොමු කිරීම ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය. තව ද, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

I. රසායනාගාර සහායක තනතුරු වල පවතින පුරප්පාඩු වලින් 50% විවෘත පදනමින්ද 50% සීමිත පදනමින්ද බඳවාගනු ලැබේ.

II. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. තෝරා ගනු ලබන අයදුම්කරුවන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රසායනාගාර සහායක තනතුරක පුරප්පාඩු පිරවීම සඳහා පත් කරනු ලැබේ.

III. තනතුරට පත් කරනු ලබන අයදුම්කරුවන්, 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවයක් ලබාගත යුතු වේ.

IV. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටින්නේය.

V. සෙසු සේවා නියමයන් සහ සේවා කොන්දේසි අංක PSC/EST/5/1/6/1/2012 හා 2012.09.27 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියටද ඊට වරින් වර සිදු කරනු ලබන සංශෝධන, නියමයන්වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**3. වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.41,800 - 10 x 490 - 10 x 540 – 10 x 590 - 12 x 630 - රු. 65,560 (PL 2 -2025) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ.

**4. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් (විවෘත හා සීමිත අයදුම්කරුවන් සඳහා) :**

I. අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

II. වෘත්තීය සුදුසුකම් :

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) දෙවන (02) හෝ තුන්වන (03) මට්ටමට නොඅඩු මට්ටමක රසායනාගාර කටයුතු පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**5. පළපුරුද්ද (විවෘත හා සීමිත අයදුම්කරුවන් සඳහා) :**

රසායනාගාරයක වසර දෙකක (02) සේවා පලපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතු අතර, එම පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතු ය.

**6. වයස් සීමාව :**

I. විවෘත අයදුම්කරුවන් සඳහා.- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2026.11.13) වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
(සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් නිකුත් කළ උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.)

II. සීමිත අයදුම්කරුවන් සඳහා .- වයස් සීමාව අදාළ නොවේ.

**7. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**8. වෙනත් සුදුසුකම් :**

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය. (ඒ බව අයදුම්කරු පදිංචි වසමේ ග්‍රාම නිලධාරි වෙතින් මාස 06ක් තුළ ලබාගත් DS 04 සහතිකයකින් හා තවත් චරිත සහතිකයකින් සනාථ කළ යුතු ය).

III. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2026.11.13) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**9. බඳවා ගැනීමේ ක්‍රමය :**

**9.1. විවෘත අයදුම්කරුවන් සඳහා :**

I. වෘත්තීය පරීක්ෂණයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

II. පළමුව වෘත්තීය පරීක්ෂණයක් පවත්වා එය සමත්වන අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

III. වෘත්තීය පරීක්ෂණයේදී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු වල එකතුව අනුව කුසලතා අනුපිළිවෙලින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

IV. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙම පරීක්ෂණ පවත්වනු ලැබේ.

V. වෘත්තීය පරීක්ෂණය :

| *විෂයයන්* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම | 20 | 40% |
| 2. උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම | 20 | |
| 3. අදාළ ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ දැනුම | 40 | |
| 4. ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 20 | |
| **එකතුව** | **100** | 40% |

**VI. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:-**

| *ලකුණු ලබාදෙන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 2. අතිරේක වෘත්තීය පුහුණුව | 60 | |
| 3. අතිරේක පළපුරුද්ද | 10 | |
| 4. අමතර සුදුසුකම් | 10 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේ දී පිළිබිඹු කරනු ලබන කුසලතා | 05 | |
| **එකතුව** | **100** | |

(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ)

**9.2. සීමිත අයදුම්කරුවන් සඳහා :-**

I. වෘත්තීය පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගනු ලැබේ.

II. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් වෘත්තීය පරීක්ෂණය පවත්වනු ලැබේ.

**III. වෘත්තීය පරීක්ෂණය :**

| *ලකුණු ලබාදෙන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම | 20 | 40% |
| 2. උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම | 20 | |
| 3. අදාළ ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ දැනුම | 40 | |
| 4. ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 20 | |
| **එකතුව** | **100** | 40% |

IV **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - අදාළ නොවේ.**

**10. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

(i) ඉල්ලුම් පත්‍රය සෙ.මී. 21 – 29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ආදර්ශ අයදුම්පත අනුව සකස් කළ යුතු ය.

(ii) සීමිත අයදුම්කරුවන් අංශ ප්‍රධානියා/ඒකක ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

(iii) සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම් දුන් විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ). ජාතික හැඳුනුම්පත / වලංගු ගුවන් ගමන් බලපත්‍රය/ වලංගු රියදුරු බලපත්‍රය;
(ආ). උප්පැන්න සහතිකය;
(ඇ). අධ්‍යාපන සහතික / වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික / පළපුරුද්ද සනාථ කරන සහතික;
(ඈ). මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එකක් ස්වදේශ කටයුතු චක්‍රලේඛ 03/2020 පරිදි පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වෙතින් මාස 06ක් තුළ ලබාගත් DS 04 සහතිකයක් විය යුතු ය.)

**11. වෙනත් විධිවිධාන :**

i. මෙම *ගැසට්* නිවේදනයේ විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතු වනු ඇත.

ii. පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතු වනු ඇත.

iii. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතු ය.

iv. අයදුම්කරුවකු මූලික සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් දැනුම් දීමකින් තොරව ඔහුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

v. අයදුම්කරුවකු ඉදිරිපත් කර ඇති යම්කිසි කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇති බව හෙළිවුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කිරීම/පත්වීම අවසන් කිරීම කරනු ලැබේ.

**වෛද්‍ය බී.එස්.එස්.පෙරේරා,**
අධ්‍යක්ෂ ජනරාල් *(වැ.බ).*

2026 ඔක්තෝබර් මස 05 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
අංක 13,
ගැටඹේ, පේරාදෙණිය.

**ආදර්ශ අයදුම්පත**

**කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ**
**ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ රසායනාගාර සහායක තනතුරට**
**බඳවා ගැනීමේ අයදුම්පත (විවෘත/සීමිත )**

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න. [ ]
සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4

අයදුම්පත යොමු කරන බඳවාගැනීමේ පදනමට අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න [ ]
(විවෘත - 05 , සීමිත - 06)

01. (i) සම්පූර්ණ නම :- (මයා/මිය/මෙය) : ..........................................................................................................
..........................................................................................................................................

(ii) සම්පූර්ණ නම ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්) :- ..............................................................................
..........................................................................................................................................

02. මුලකුරු සමග නම (මයා/මිය/මෙය) : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
උදා:- BANDARA. A.B
..........................................................................................................................................

03. ස්ථිර ලිපිනය (සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය මෙම ලිපිනයට එවනු ලැබේ) :
..................................................................................................................................................................
..................................................................................................................................................................

04. ස්ත්‍රී / පුරුෂ භාවය : (පුරුෂ - 1 , ස්ත්‍රී - 2)
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න) ☐

05. විවාහක / අවිවාහක බව: (විවාහක - 1, අවිවාහක - 2, වෙනත්- 3)
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න) ☐

06. ජන වර්ගය: සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ -3, මුස්ලිම් - 4, වෙනත් - 5
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න) ☐

07. ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐☐☐

08. දුරකතන අංකය :

ජංගම: ☐☐☐☐☐☐☐☐☐☐

ස්ථාවර: ☐☐☐☐☐☐☐☐☐☐

09. (අ) උපන් දිනය:

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ආ) ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට (2026.11.13) වයස:

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

10. අධ්‍යාපන සුදුසුකම්:

(අ) I සාමාන්‍ය පෙළ (පළමු වර) - පෙනී සිටි වර්ෂය- ...................විභාග අංකය................

| *අනු. අංකය* | *විෂයය* | *ලබාගත් සාමාර්ථයන්* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(අ) II සාමාන්‍ය පෙළ (දෙවන වර) - පෙනී සිටි වර්ෂය- ....................විභාග අංකය............

| *අනු. අංකය* | *විෂයය* | *ලබා ගත් සාමාර්ථයන්* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ආ) උසස් පෙළ (සමත් නම්) - පෙනී සිටි වර්ෂය - ..........විෂය ධාරාව- ..................විභාග අංකය. ..................

| *අනු. අංකය* | *විෂයයන්* | *ලබා ගත් සාමාර්ථයන්* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. වෘත්තීය සුදුසුකම් :

| *වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය* | *NVQ මට්ටම* |
|---|---|
| | |
| | |

12. පළපුරුද්ද :

| *පළපුරුද්ද ලබාගත් ආයතනය* | *පළපුරුද්දට අදාළ සේවා කාලය* |
|---|---|
| | |
| | |

13. *ගැසට් නිවේදනයේ* සඳහන් මූලික සුදුසුකම් ලබා ගැනීමට අදාළ පහත සඳහන් ලේඛනවල තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත් පහත සඳහන් පිළිවෙලට අයදුම්පත්‍රය සමග අමුණා ඉදිරිපත් කළ යුතු ය.

I. අධ්‍යාපන සහතිකවල ;
II. වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික වල;
III. පළපුරුද්ද සනාථ කරන සහතික වල;

IV. උප්පැන්න සහතිකය;
V. වලංගු ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ බලපත්‍රය / වලංගු රියදුරු බලපත්‍රය.

14. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයෙහි ම විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත්, මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වැරදිකරුවෙකු වී නොමැති බව ද මගේ සුපුරුදු අත්සන තබා මින් සහතික කරමි.

දිනය:-............................... ..............................,
අයදුම්කරුගේ අත්සන.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (රජයේ මාණ්ඩලික/විධායක නිලධාරියකු/වසමේ ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතු ය.)

මෙහි අත්සන් කරන ලද.......................................................හි පදිංචි .............................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහුගේ/ඇයගේ අත්සන ..................දින මා ඉදිරිපිට දී තැබූ බව ද සහතික කරමි.

දිනය....................................... ................................................................,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.

සහතික කරන්නාගේ නම :-..................................................
තනතුර:-..................................................
ලිපිනය:-.........................................................
දිනය:-..........................................................

16. අංශ/ ඒකක ප්‍රධානියාගේ සහතිකය :
(දැනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක් දරන අපේක්ෂකයන්ට පමණක් අදාළ වේ)

මෙම දෙපාර්තමේන්තුවේ ................................... අංශයේ සේවය කරන......................................... මයා /මිය / මෙනවිය දැනට....................................තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ වැඩ, පැමිණීම සහ හැසිරීම සතුටුදායක වන බවත්, කිසිදු විනය දඬුවමක් ලබා නොමැති බවත්, ඉදිරියේ දී විනය කටයුතු ආරම්භ කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු /ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය / නොහැකිය.

දිනය : ......................... ...............................................,
අත්සන හා නිල මුද්‍රාව.

10 - 537

## කම්කරු දෙපාර්තමේන්තුව

### කම්කරු දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පයිප්ප වැද්දුම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026

කම්කරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පයිප්ප වැද්දුම්කරු තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, එනම් 2026.11.16 දිනට පහත 03 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණකර ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** 1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | පයිප්ප වැද්දුම්කරු | 01 |

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|---|
| 01 | පයිප්ප වැද්දුම්කරු | – කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල ජලනල හා මළ ප්‍රවාහන පද්ධතිය නඩත්තු කිරීමේ කටයුතු<br>– නව ජලනල සම්බන්ධතා කටයුතු<br>– සනීපාරක්ෂක හා අනෙකුත් උපකරණ අලුත්වැඩියාව<br>– දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන වෙනත් කාර්යයන් |

**02.** **බඳවා ගැනීමේ ක්‍රමය :**

මූලික සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවා, වෘත්තීය පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරුවලට බඳවා ගනු ලැබේ.

**03.** **බඳවා ගැනීමේ සුදුසුකම් :**

3.1. අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම.

3.2. වෘත්තීය සුදුසුකම් - පයිප්ප වැද්දුම්කරු ක්ෂේත්‍රය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණකර තිබීම.

3.3. පළපුරුද්ද - අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර සහතික මගින් සනාථ කළ යුතු ය.

3.4. කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

3.5. වෙනත් සුදුසුකම් -

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණකර තිබිය යුතු ය.

3.6. වයස - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
(රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**04.** **වැටුප් පරිමාණය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව PL-2-2025 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට රු.41,800 - 10X490 - 10X540 - 10X590 - 12X630 - රු.65,560/- ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

**05.** **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

5.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාමික වැටුප් සහිතය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

5.2 මෙම පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

5.3 III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සම්බන්ධයෙන් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට ආනුෂංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

5.5 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, 2013.04.18 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පටිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද මෙම පත්වීම යටත් වේ.

**06.** 6.1 වෘත්තීය පරීක්ෂණය -

| *විෂය නිර්දේශය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| – T හෝ L මුට්ටු සකස් කිරීම<br>– Valve joint එකක් සකස් කිරීම<br>– කරාම ස්ථානගත කිරීම<br>– එක් එක් කාර්යයන්ට අදාළව අලුත්වැඩියා සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා භාණ්ඩ ලැයිස්තුව ලබා ගැනීම | 100 | 40% |

6.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය -

| *පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 30 | |
| අතිරේක පළපුරුද්ද | 40 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

**07.** **විභාග ගාස්තු :**

මෙම විභාගය සඳහා ගාස්තුව රු. 250/- කි. එම විභාග ගාස්තුව මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100169026274 දරන ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැලවන සේ අලවා එවිය යුතු ය.
(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

*සටහන :* විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම පරීක්ෂණය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය.

**08. අයදුම් කිරීමේ ක්‍රමය :**

8.1 මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත සෙ.මී. 22x29 ප්‍රමාණයේ A4 කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින්;

(අ) අංක 01 සිට 07 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද, අංක 08 සිට 11 දක්වා ඡේදයන් දෙවන පිටුවට ද, අංක 12 සිට 14 දක්වා ඡේදයන් තෙවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවටද වන ලෙස සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය.

(ආ) අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් පරීක්ෂණයේ නම සිංහල / දෙමළ මාධ්‍ය අයදුම්පත්‍රවල සිංහලට දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු වේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරුවන් විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

8.2 අයදුම්පත් එවිය යුතු ආකාරය:

මෙම අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ **"ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පයිප්ප වැද්දුම්කරු. තනතුරට බඳවා ගැනීම අයදුම්පත් කැඳවීම - 2026"** යන්න සඳහන් කළ යුතු ය. තැපැලේ දී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.11.16 දින හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ.

කම්කරු කොමසාරිස් (ආයතන)
කම්කරු දෙපාර්තමේන්තුව,
08 වන මහල,
"මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල,
කොළඹ 05.

8.3 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු,දිවුරුම්කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

**09. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම:**

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම පරීක්ෂණයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුව හොත් පරීක්ෂණයට පෙර හෝ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම් ලැබීමෙන් පසුව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත්කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඔහු/ ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

**10. අපේක්ෂකයාගේ අනන්‍යතාවය:**

වෘත්තීය පරීක්ෂණය/ සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී අපේක්ෂකයන් ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

**11.** මෙම පරීක්ෂණය පැවැත්වීම, පත්වීම් ලබා දීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳ අවසන් තීරණය කම්කරු කොමසාරිස් ජනරාල් සතු වන්නේය.

**12.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 ඔක්තෝබර් මස 02 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**කම්කරු දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පයිප්ප වැද්දුම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026**

**01.** **විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :**
සිංහල 2
දෙමළ 3
ඉංග්‍රීසි 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

**02.** **පෞද්ගලික තොරතුරු :**

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ……………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ ( PERERA H.A.L.S)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ……………………………………………………………
……………………………………………………………………………………………………………

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ……………………………………………………………………
……………………………………………………………………………………………………………

**03.** **ලිපිනය :**

3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

3.3 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ……………………………………………………………………
……………………………………………………………………………………………

**04.** **ස්ත්‍රී පුරුෂ භාවය :** (පුරුෂ - 0, ස්ත්‍රී - 1)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

**05.** **ජාතික හැඳුනුම්පත් අංකය :** | | | | | | | | | | | | |

**06.** **ජංගම දුරකතන අංකය :** | | | | | | | | | | |

**07.** **විවාහක/ අවිවාහක බව :** (අවිවාහක-1, විවාහක-2)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

**08.** **8.1 උපන් දිනය :** වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

8.2 2026.11.16 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

09. අධ්‍යාපන සුදුසුකම්:

09.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය : (පළමුවර)

(i.) විභාගයේ වර්ෂය හා මාසය : ...............................

(ii.) විභාග අංකය : ...............................

| විෂයය | සාමාර්ථය | විෂයය | සමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

09.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය : (දෙවනවර)

(i.) විභාගයේ වර්ෂය හා මාසය : ...............................

(ii.) විභාග අංකය : ...............................

| විෂයය | සාමාර්ථය | විෂයය | සමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

**10. වෘත්තීය සුදුසුකම්:**

| පාඨමාලාවේ නම | කාලසීමාව | NVQ මට්ටම | ආයතනය |
|---|---|---|---|
| | | | |

**11. පළපුරුද්ද :**

| පුහුණුව ලැබූ හෝ සේවය කළ ආයතනයේ නම | කාලසීමාව |
|---|---|
| | |

**12.** ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේ ද ?
(අදාළ කොටුවේ ( √ ) ලකුණ යොදන්න.

| ඔව් | | නැත | |
|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම් ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

**13.** විභාග ගාස්තු ගෙවීම :

13.1 ගෙවූ මුදල : ..........................................................................................................................................

13.2 ගෙවන ලද බැංකුව : ................................................................................................................................

13.3 ගෙවූ දිනය : ...........................................................................................................................................

13.4 ලදුපත් අංකය : .......................................................................................................................................

| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත) |
|---|

**14.** *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් විසින් පනවනු ලබන නීති රීති වලට අනුකූලව ක්‍රියා කිරීමටත්, මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් පරීක්ෂණයට පෙර හෝ පරීක්ෂණයෙන් පසුව හෝ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

(ඇ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ............................ ..........................................,
අයදුම්කරුගේ අත්සන.

**15.** අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................................................මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ................................................. වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

....................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය : ..........................................................................................

සහතික කරන නිලධාරියාගේ නම : ..........................................................

තනතුර: ..........................................................................................

ලිපිනය: ..........................................................................................

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

### භාෂා පරිවර්තක (සිංහල / දෙමළ - දෙමළ / සිංහල) 1 වන පන්තිය සඳහා බඳවා ගැනීම

භාෂා පරිවර්තක (සිංහල / දෙමළ - දෙමළ / සිංහල) 1 වන පන්තිය - තනතුරු 01
ඉහත තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් :**

(1) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන විභාගයක දී අදාළ පරිවර්තන භාෂා මාධ්‍ය 02 සඳහා සම්මාන සාමාර්ථ්‍යය ලබා තිබීම හෝ ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම;

*සහ*

(2) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

*සහ*

(3) සිංහල/ දෙමළ භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

**වැටුප් පරිමාණය** : මාසික දීමනාව (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව සියලු දීමනා ඇතුළත් මාසික දීමනාව)
2026 වර්ෂය සඳහා - රු. 86,623/- (68,823/- + 17,800/-)
2027 වර්ෂය සඳහා - රු. 93,290/- (75,490/- + 17,800/-)

**වැටුප් කේතය** : රා.ප.ච. 10/2025 අනුව එම්.එන්. - 6 (MN - 6 2025)

**වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 65 ට නොවැඩි විය යුතු ය.

**සේවා නියුක්ති කොන්දේසි:** පවතින පුරප්පාඩු ස්ථිර පදනමින් පුරවන තෙක් හෝ වසර දෙකක (02) කාල සීමාවක් සඳහා යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන අයදුම්කරුවන් අතරින් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් පමණක් ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සහ ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

- පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට
- පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට

**අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය :** 2026.10.30

පත්වීමක් සිදුකිරීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතු වේ.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"භාෂා පරිවර්තක (සිංහල / දෙමළ - දෙමළ / සිංහල) 1 වන පන්තිය සඳහා බඳවා ගැනීම"** ලෙස සඳහන් කළ යුතු ය.

මෙම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අයදුම්කරුවන් තම අධ්‍යාපන සුදුසුකම් ඇතුළත් කර සකස් කළ ජීව දත්ත පත්‍රිකාව, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (02) නම්, ලිපින, දුරකතන අංක ද ඇතුළත්ව අදාළ දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. වෘත්තීය පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැළකේ.

*සැ.යු.* - ඉහත තොරතුරු ඇතුළත් කර නොමැති අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 353,
කෝට්ටේ පාර, රාජගිරිය.

10 - 674/1

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

පොළොන්නරුව සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම

පොළොන්නරුව සංචාරක බංගලා භාරකරු තනතුර - තනතුරු 01
ඉහත තනතුර සඳහා **කොන්ත්‍රාත් පදනම මත** බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් :**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

**වෘත්තීය සුදුසුකම් :**

පෙරදිග හා අපරදිග ආහාර පිසීම පිළිබඳව මනා දැනීමක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**පළපුරුද්ද :**

තානායම් වල හෝ ඒ හා සමාන වෙනත් පිළිගත් ආයතනයක ආහාර සැපයීම පිළිබඳව වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

**තනතුරට පැවරෙන කාර්යයන් :**

සංචාරක බංගලාව භාරව කටයුතු කිරීම, අමුත්තන් පිළිගැනීම සහ ඔවුන්ට අවශ්‍ය ආහාරපාන, ඉඳුම් හිටුම් ආදිය සලසා දීම, සංචාරක බංගලාවේ ගොඩනැගිලි හා බඩු බාහිරාදිය පිළිබඳ වගකීම දැරීම, බංගලාව පිරිසිදු කිරීම
**වැටුප් පරිමාණය :** මාසික දීමනාව (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව සියලු දීමනා ඇතුළත් මාසික දීමනාව)

2026 වර්ෂය සඳහා - රු. 56,663/- (38,863/- + 17,800/-)
2027 වර්ෂය සඳහා - රු. 57,800/- (40,000/- + 17,800/-)

**වැටුප් කේතය :** රා.ප.ච. 10/2025 අනුව පී.එල්. – 1 (PL - 1 2025)

**වයස :** අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 50 ට නොවැඩි විය යුතුය. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**සේවා නියුක්ති කොන්දේසි :** පවතින පුරප්පාඩු ස්ථිර පදනමින් පුරවන තෙක් හෝ වසර දෙකක (02) කාල සීමාවක් සඳහා යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය : **2026.10.30**

පත්වීමක් සිදුකිරීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතු වේ.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"පොළොන්නරුව සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම"** ලෙස සඳහන් කළ යුතු ය.

මෙම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අයදුම්කරුවන් තම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළත් කර සකස් කළ ජීව දත්ත පත්‍රිකාව, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (02) නම්, ලිපින, දුරකතන අංක ද ඇතුළත්ව අදාළ දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

*සැ.යු.* - ඉහත තොරතුරු ඇතුළත් කර නොමැති අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර, රාජගිරිය.

10 - 674/2

### ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

කාර්මික නිලධාරි III ශ්‍රේණිය - තනතුරු 01
ඉහත තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**කාර්මික නිලධාරි (III ශ්‍රේණිය)**

**අධ්‍යාපන සුදුසුකම් -:**

ක්ෂේත්‍රයට අදාළ විෂයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**වෘත්තීය සුදුසුකම් -:**

1. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

4. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව;

*හෝ*

5. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

6. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

7. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

8. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**පළපුරුද්ද -:** අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය -:** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව මාසික දීමනාව (සියලු දීමනා ඇතුළත් මාසික දීමනාව)

| | |
|---|---|
| 2026 වර්ෂය සඳහා - | රු.67,002/- (49,202+17,800) |
| 2027 වර්ෂය සඳහා - | රු.70,050/- (52,250+17,800) |

**වැටුප් කේතය-:**
**රා.ප.ච.10/2025 අනුව එම් එන් - 03** (MN 03 – 2025)

**වයස-:** අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

**බඳවා ගැනීමේ ක්‍රමය-:** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සෙකු තෝරා ගනු ලැබේ.

**සේවා නියුක්ති කොන්දේසි-:** පවතින පුරප්පාඩු ස්ථිර පදනමින් පුරවන තෙක් හෝ වසරක කාල සීමාවක් සඳහා වන දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා කොන්ත්‍රාත් පදනම මත අනුයුක්ත කරනු ලැබේ.

**අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය-: 2026.10.30**

පත්වීමක් සිදු කිරීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතුවේ.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ “කාර්මික නිලධාරි තනතුර (කොන්ත්‍රාත්) සඳහා අයදුම්පත” ලෙස සඳහන් කළ යුතු ය.

අයදුම්කරුවන් තම සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවට ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම, ලිපිනය, දුරකථන අංකය ද ඇතුළත් කර අදාළ දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය.

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර,
රාජගිරිය.

10 - 674/3

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026) 2017)

### First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics -2017 (2026)

**01.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධානවලට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2027 ජනවාරි** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Service” යටතේ ඇති “Online Applications – Recruitment Exams/E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ඔක්තෝබර් මස 19 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 නොවැම්බර් මස 13 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

- *සටහන*
  අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**02.** (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත.

**03.** **විභාග ගාස්තු :** විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට හෝ පළමුවරට අයදුම් කරන අයදුම්කරුවන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු අයදුම් කරන ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 200/- ක විභාග ගාස්තුවක් අය කෙරේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

(i.) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

(ii.) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)

(iii.) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / “Flex” යෙදවුම මගින් (Online Banking Method / “Flex” App of Bank of Ceylon)

(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of Bank of Ceylon)

- *සටහන :*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

04. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail ) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තම ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත /විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.1 විභාගයට ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

6.2 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ සහතික කරවා ගත යුතු ය.

6.3 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

07. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති, ප්‍රථම වතාවට විභාගය සඳහා පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08 08.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍යය ලෙස, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද, තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08.2 විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයයන් එක් වරකදී හෝ කිහිප වරකදී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

**10. විභාග පටිපාටිය**

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත :-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1.මූලික සංඛ්‍යාන ක්‍රම | පැය 2 | 100 | 40% |
| 2.කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 3. මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| | *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 1 | මූලික සංඛ්‍යාන ක්‍රම | ➢ දත්ත එක්රැස් කිරීම හා ඉදිරිපත් කිරීම, t ව්‍යාප්ති, ප්‍රමථ ව්‍යාප්ති, t කල්පිත පරීක්ෂා මූලධර්ම හා $X^2$ පරීක්ෂා, ජාල රේඛය හා සංඛ්‍යාත වක්‍ර කේන්ද්‍රික ප්‍රවණතාව හා අපකිරණයේ මිනුම් (මාතය, මධ්‍යස්ථය, මධ්‍යයන, විචලතාව, චතුර්ථක හා සම්මත අපගමනය) නියැදුම්වාදයේ මූලධර්ම, නියැදුම් සමීක්ෂණය, නියැදුම් දෝෂය, හා නොනියැදුම් දෝෂය, දර්ශක අංක, සරල සහසම්බන්ධතාව, රේඛීය ප්‍රතිපායනය සහ සංඛ්‍යාන විද්‍යා මූලික දැනුම<br><br><u>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය</u><br><br>*a)* මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විත වේ.<br><br>*b)* පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |
| 2 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ II,III,IV,V,VIII,XII,XIII,XIV,XIX යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳව ද අවධානයට ගතයුතු වේ.<br><br><u>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය</u><br><br>*a)* මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විත වේ.<br><br>*b)* පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ව්‍යුහගත ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතු ය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |

| | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|---|
| 3 | මුදල් රෙගුලාසි | මෙය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ :<br><br>➢ I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු.රෙ.1 සිට 68 දක්වා)<br><br>➢ III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායි බව, ප්‍රධාන ගණක නිලධාරීන්, ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන් ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු.රෙ.124 සිට 147 දක්වා)<br><br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය<br><br>a) මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විත වන අතර, අනෙක් ප්‍රශ්න 05 අනු කොටස් 05කින් සමන්විත වේ.<br><br>b) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතු ය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |

*සටහන :*

- ➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.
- ➢ නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාද අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,

සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

10 - 637

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026) 2017)

## Second Efficiency Bar Examination for Grade I Statistical Officers in the Department of Census and Statistics – 2017 (2026)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරින් සඳහා අදාළ අනුමත බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධානවලට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි I ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2027 ජනවාරි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ** www.doenets.lk වෙබ් අඩවියේ “Our Service” යටතේ ඇති “Online Applications – Recruitment Exams/E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ඔක්තෝබර් මස 19 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර, 2026 නොවැම්බර් මස 13 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.** අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

- *සටහන :*
  අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

03. විභාග ගාස්තු : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර දෙකක දී හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයයකට හෝ පළමුවරට අයදුම් කරන අපේක්ෂකයන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු අයදුම් කරන ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 250/- ක විභාග ගාස්තුවක් අය කෙරේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය :-

(i.) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
(ii.) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);
(iii.) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම (Online Banking Method of Bank / “Flex” App of Ceylon);
(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of Bank of Ceylon).

- *සටහන :*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(ඈ) පූර්ව විභාගයකට අයදුම්පත් යොමු කර විභාග ප්‍රවේශ පත්‍රය ලැබීමෙන් පසු කවර හෝ කරුණක් මත විභාගයට පෙනී නොසිටිය ද එම අයදුම්කරුවන් මෙම විභාගයේ දී විභාග ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතු වේ. පළමුවරට විභාගයට අයදුම් කරන බවට සාවද්‍ය ලෙස සඳහන් කර ගාස්තු නොගෙවා මෙම විභාගයට පෙනී සිට, ඒ බව අනාවරණය වීමෙන් පසු ගනු ලබන ක්‍රියාමාර්ගවල අහිතකර ප්‍රතිඵල නිලධාරියා විසින් විඳ දරා ගත යුතු වේ.

04. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail ) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ :-

- I. ජාතික හැඳුනුම්පත;
- II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
- III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

05.1 විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

05.2 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය.

05.3 විභාගය සඳහා පෙනී සිටින දිනයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

06. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති, ප්‍රථම වතාවට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

07.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍යය ලෙස, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

07.2 විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයයන් එක් වරක දී හෝ කිහිප වරකදී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

08. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

**09. විභාග පටිපාටිය**

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

| *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 2. මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|---|
| 1 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ XV,XVI,XXIII,XXIV,XXV,XXVII, XXVIII,XXX, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද අවධානයට ගතයුතු වේ.<br><br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය<br><br>a) මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විත වේ.<br><br>b) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ව්‍යුහගත ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතු ය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |
| 2 | මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br><br>a) VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරීත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්<br>• 1 වැනි කොටස - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරීත්වය හා ආරක්ෂාව<br>• 2 වැනි කොටස - උප පත්‍රිකා පොත්<br>• 3 වැනි කොටස - මුදල්, මුද්දර යනාදිය පිළිබඳ සමීක්ෂණ මණ්ඩල<br>• 4 වැනි කොටස - අග්‍රිම<br>• 5 වැනි කොටස - බැංකු ගිණුම්<br>( මු.රෙ. 315 සිට 396 දක්වා සහ ඒවායේ සියලුම සංශෝධන පිළිබඳව ද අවධානයට ගත යුතු ය.)<br><br>b) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 - භාණ්ඩ හා වැඩ යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ඒවායේ සියලුම සංශෝධන පිළිබඳවද අවධානයට ගත යුතුය. {XIII වන පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා සැපයීම් මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණය, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පටිපාටියේ බැහැර වීම ( මු.රෙ.708 සිට 775 දක්වා) }<br><br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය<br><br>c) මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විත වේ.<br><br>d) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ව්‍යුහගත ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතු ය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි . |

*සටහන -*

- ➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.
- ➢ නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතුවේ.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. මෙම *ගැසට්* නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාද අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

10 - 638

---

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**

(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

**ව්‍යාපාර හා අලෙවිකරණ උපායමාර්ග පිළිබඳ උපදේශන ඩිප්ලෝමාව 2026/2027**
(ප්‍රධාන බඳවා ගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ව්‍යාපාර සහ අලෙවිකරණ උපායමාර්ග පිළිබඳ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, උසස් පෙළ අවසන් කළ ශිෂ්‍යයින්, ව්‍යාපාර අංශයෙන් අධ්‍යාපනයේ නිරත ශිෂ්‍යයින්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, ව්‍යාපාරයක් ඇරඹීමට සිටින හෝ විදේශගතවී සිටින, විදේශගත වීමට බලාපොරොත්තුවෙන් සිටින හෝ ව්‍යාපාර කළමනාකරණය, අලෙවිකරණය සහ උපදේශනය පිළිබඳව උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම්පත් කැඳවා ඇත.

**සුදුසුකම් :** අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3ක් සහිතව සමත් වීම.

*හෝ*

වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

සම්පූර්ණ අර්ස (Total Credits) : 30කි.

සාමාසික ගණන : සාමාසික 02කි.

***ඩිප්ලෝමාවේ ස්වභාවය :*** මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

**ඉගැන්වීම් ක්‍රමවේදය :** LMS පද්ධතිය හරහා ඉගැන්වීම් නිබන්ධන ලබාදීම සිදුකෙරේ. පහසු දිනයක් තුළ දී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ

***මාධ්‍ය :*** සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය : මාස 12කි**

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු :** සම්පූර්ණ ඩිප්ලෝමාව සඳහා අයකිරීම රු. 36,000.00 කි. ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1,000.00ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතුය. රු. 36,000.00 ක මුදල එකවර හෝ වාරික 12කින් ගෙවා අවසන් කළ හැකිය.

***පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :*** අයදුම්කරුවන් විසින්,

1. අනන්‍යතාවය හඳුනාගැනීමේ ලේඛනයක්
2. අ.පො.ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහතික ඡායාරූප,
3. තම වර්ණවත් පැහැදිලි ඡායාරූපයක්

070 - 533 7702 (WhatsApp) අංකයට යොමු කළ යුතු ය.

***වැඩි විස්තර සඳහා :*** කාර්යාල වේලාවන් වන පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා 081 - 316 9800 දුරකතන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

10 - 571

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### කළමනාකරණ සහකාර III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ද්විතීය සේවා මට්ටම (තාක්ෂණික නොවන) කළමනාකරණ සහකාර III ශ්‍රේණියෙහි තනතුරු පුරප්පාඩු 55 සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් :-**

1.1. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින්( සිංහල/ දෙමළ, ඉංග්‍රීසි,ගණිතය විෂයයන්ට සම්මාන ඇතුළුව) සම්මාන හතරක් ඇතුළුව විෂයයන් හයක් සමත් වී තිබීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 3 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

1.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

1.3. පළපුරුද්ද : අදාළ නොවේ.

1.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

1.5. වෙනත් සුදුසුකම් :
i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**2. වයස :-**
- අවම සීමාව අවුරුදු 21
- උපරිම සීමාව අවුරුදු 35

**3. වැටුප් පරිමාණය :-** රු. 46,220.00-10x540-7x630-4x890-20x1190- රු.83,390.00
ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් කේතය AC-MA-1-1-2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.46,220/- වේ. මීට අමතරව පාර්ලිමේන්තුව විසින් 2026.03.17 තනතුරට අදාළ වන පරිදි අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. (අංක 2504/07 හා 2026.09.01 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* ඇතුළත් දීමනා වේ.)

**4. බඳවා ගැනීමේ ක්‍රමය :-** 100% විවෘත පදනමින් බඳවා ගැනේ.

4.1 ලිඛිත විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සමන්විත වේ.

4.1.1 ලිඛිත විභාගය-
ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර 2 කින් සමන්විත වන අතර කොළඹ දී පවත්වනු ලැබේ.

| *විෂය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| භාෂා හැකියාව | පැය 02 | 100 | 40 |
| අභියෝග්‍යතාවය | පැය 01 | 100 | 40 |

විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| භාෂා හැකියාව | අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශ කිරීම, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ප්‍රස්ථාර, වගු සකස් කිරීම,සාරාංශය ආදී හැකියාවන් පරීක්ෂා කෙරේ. |
| අභියෝග්‍යතාවය | අපේක්ෂකයාගේ තර්කන ශක්තිය මැනීම පිණිස සකසන ලද ප්‍රශ්න පත්‍රයකි. |

විභාගය පවත්වනු ලබන මාධ්‍ය:

- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි
- අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතු ය. එම භාෂා මාධ්‍ය තනතුරට බඳවා ගැනීමේ භාෂා මාධ්‍ය වේ. (අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර නැත.)

සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතු ය.

4.1.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය -

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | 60 |
| සේවා පළපුරුද්ද | 15 | |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය හා පරිගණක සාක්ෂරතාවය | 10 | |
| විෂයානුබද්ධ දැනුම | 25 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 30 | |
| මුළු ලකුණු | 100 | |

*සටහන :* (i.) ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබූවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා වූ අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවේ දෙගුණයක ප්‍රමාණය වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණු සංඛ්‍යාව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ.

(ii.) බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

(iii.) ලිඛිත පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබාගත් ලකුණුවල එකතුවෙහි ඉහළම කුසලතාවය දක්වන අයදුම්කරුවන් පුරප්පාඩු ගණන අනුව තෝරා ගනු ලැබේ.

**5. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :-**

i. මෙම පත්වීම අංක 2504/07 හා 2026.09.01 දිනැති *ගැසට්* නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට යටත් වේ.
ii. මෙම තනතුර ස්ථිර ය. සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාර අරමුදල් ප්‍රතිලාභ හිමි ය.
iii. මෙම පත්වීම අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වේ.
iv. තනතුරට බඳවා ගෙන වසර 3 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

v. පරිවාස කාලය අවසානයේ වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක වීම හා කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සළකා බලා සේවය ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

vi. කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙනු ලබන කාර්ය සාධන ඇගයීම් දර්ශක අනුව වාර්ෂිකව ඔබගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරේ. ඒ අනුව ඉදිරි වැටුප් වර්ධක ලබා දීම සිදුකරන අතර උසස් වීම් සඳහා ද එම කාර්ය සාධනය උපයෝගී කරනු ලැබේ.

vii. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

viii. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත, අංක 2504/07 හා 2026.09.01 දිනැති *ගැසට්* නිවේදනයෙහි ඇතුළත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා රීති, ආයතන සංග්‍රහය II, මුදල් රෙගුලාසි හා වරින්වර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පනවනු ලබන රීතිවලට සහ චක්‍රලේඛවලට මෙම පත්වීම යටත්ය.

ix. විභාගය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයා කැමති එක් භාෂා මාධ්‍යකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය.

x. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-**

(i.) ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
(ii.) ලිඛිත/ ව්‍යුහගත පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.
   (a) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
   (b) වලංගු විදේශ ගමන් බලපත්‍රය
   (c) වලංගු රියදුරු බලපත්‍රය

**7. විභාග ගාස්තු :-** විභාග ගාස්තුව රු.1000.00 කි. එම ගාස්තුව ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ගිණුම් අංක 92603543 ට බැර වන සේ ගෙවිය යුතු ය. ගෙවනු ලබන විභාග ගාස්තුව කවර හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා රිසිට් පත මෙම අයදුම් පත්‍රයේ ඇලවිය යුතු අතර එහි ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු වේ.

**8. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-**

(i.) අයදුම්පත්, අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, තැ.පෙ.1431, 36, මලලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනය සඳහන් කර 2026.11.16 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii.) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක **ඉංග්‍රීසි** භාෂාවෙන් පමණක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

(iii.) අයදුම්පත් බහා එවන ලිපි කවරය ඉහළ වම් කෙළවරේ "කළමනාකරණ සහකාර III ශ්‍රේණියට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iv.) අයදුම්පත්‍රයෙහි අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.71,240/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v.) අයදුම්පත් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදු විය හැකි ප්‍රතිවිපාක තමන් විසින්ම විඳ දරාගත යුතු ය.

(vi.) අයදුම්පත්‍රය සමග පහත ලේඛනවල සහතික කරන ලද එක් ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය.

- (a) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත.
- (b) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත.
- (c) අයදුම්පතේ සඳහන් කරනු ලබන මූලික සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත්.
- (d) විභාග ගාස්තු ගෙවන ලද බව සනාථ කෙරෙන ලේඛනය

*සටහන :* සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථ කර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**9.** **සාවද්‍ය තොරතුරු සැපයී :-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** **පුරප්පාඩු පිරවීම / නොපිරවීම පිළිබඳ අවසාන තීරණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වේ.**

**11.** **බඳවා ගැනීම් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.**

**12.** **මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ආර්.එස්.ඒ.දිසානායක,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 ඔක්තෝබර් මස 13 වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
තැ.පෙ. 1431,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
**විවෘත පදනම මත කළමනාකරණ සහකාර III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ අයදුම්පත - 2026**

මාධ්‍ය

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

(අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතු ය)

| | | |
|---|---|---|
| 1.0 | 1.1. සම්පූර්ණ නම | |
| | 1.2. සම්පූර්ණ නම (සිංහල / දෙමළ) | |
| | 1.3. මුලකුරු සමග නම | |

| | | |
|---|---|---|
| 2.0 | 2.1. ස්ථිර ලිපිනය | |
| | 2.2 ලිපි යොමුකළ යුතු ලිපිනය | |
| | 2.3. දිස්ත්‍රික්කය | |
| | 2.4. පළාත | |
| 3.0 | 3.1. ස්ත්‍රී/ පුරුෂ භාවය | |
| | 3.2. ජාතික හැඳුනුම්පත් අංකය | |
| 4.0 | 4.1. ජංගම දුරකතන අංකය සහ whatsapp අංකය | |
| | 4.2. ස්ථාවර දුරකතන අංකය | |
| | 4.3. විද්‍යුත් තැපෑල | |
| 5.0 | 5.1. උපන් දිනය | |
| | 5.2. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස | අවු: මාස: දින: |
| 6.0 | 6.1. විවාහක / අවිවාහක බව | |
| 7.0 | ජාතිය | |
| 8.0 | ආගම | |

9.0 අධ්‍යාපන සුදුසුකම්: භාෂා මාධ්‍යය: ................................................................

| අ.පො.ස. (සාමාන්‍ය පෙළ) වර්ෂය : .............................. විභාග අංකය : .......................................... | | | |
|---|---|---|---|
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

| අ.පො.ස. (උසස් පෙළ) වර්ෂය : .............................. විභාග අංකය : .......................................... | | | |
|---|---|---|---|
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| | | | |
| | | | |
| | | | |

10.0 සේවා පළපුරුද්ද:-

| ආයතනය | කාලය (අවුරුදු ගණන) |
|---|---|
| | |
| | |
| | |

11.0 අතිරේක අධ්‍යාපන සුදුසුකම් : (බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම්වලට පරිබාහිර වූ අධ්‍යාපන සුදුසුකම්)

| විභාගය/ පාඨමාලාව | ආයතනය | ප්‍රතිඵල |
|---|---|---|
| | | |
| | | |
| | | |

12.0. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :

| සුදුසුකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි ලේඛන |
|---|
| 1. |
| 2. |
| 3. |

13.0 පරිගණක සාක්ෂරතාවය:

| පාඨමාලාව | ආයතනය | කාලසීමාව |
|---|---|---|
| 1. | | |
| 2. | | |

14.0 වෙනත් සුදුසුකම් :-
…………………………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………………………………

15.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

ඔව් නම් විස්තරය සඳහන් කරන්න ……………………………………………………………………………………
…………………………………………………………………………………………………………………………

16.0 විභාග ගාස්තු ගෙවූ රිසිට් පත පිළිබඳ විස්තර :-
දිනය …………………………………………………………………………………………………………………

ගෙවන ලද මුදල ..........................................................................................................................
(මුදල් ගෙවූ රිසිට් පතෙහි මුල් පිටපත නොගැලවෙන සේ මෙහි අලවන්න)

17.0 *අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ ප්‍රකාශය:*

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් වැරදි හෝ සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව හෝ හෙළි වුවහොත් මාගේ අපේක්ෂකත්වය/ හෝ පත්වීම අවලංගු කිරීමේ අයිතිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු බව දනිමි.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් පවතින නීති රීතිවලට බැඳී සිටීමට හා නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගිය හොත් බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව මාගේ අපේක්ෂකත්වය/ හෝ පත්වීම අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට යටත් වන බවට මම එකඟ වෙමි.

............................................................,
අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

දිනය:…………………………………...

18. *අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................................................................................... මහතා/ මහත්මිය/ මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ........................................... දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බව මෙයින් සහතික කරමි.

..................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

අත්සන සහතික කරන නිලධාරියාගේ

සම්පූර්ණ නම :-.........................................................................................

තනතුර :-.........................................................................................

ලිපිනය :-.........................................................................................

දිනය :-.........................................................................................

10 - 656/1

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්යාල කාර්ය සහයක III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රාථමික සේවා මට්ටම (ශිල්පීය නොවන) කාර්යාල කාර්ය සහයක III ශ්‍රේණියෙහි තනතුරු පුරප්පාඩු 85 සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් :-**

1.1. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයයන් හයක් සමත් වී තිබීම.

1.2. වෘත්තීය සුදුකම් : අදාළ නොවේ.

1.3. පළපුරුද්ද : අදාළ නොවේ.

1.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

1.5. වෙනත් සුදුසුකම් :
(i.) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ii.) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii.) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**2. වයස :-**
- අවම සීමාව අවුරුදු 21
- උපරිම සීමාව අවුරුදු 32

**3. වැටුප් පරිමාණය :-** රු. 40,500-10x450-10x490-7x540-15x590 - රු.62,530
ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් කේතය AC-PL-1-2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.40,500 වේ. මීට අමතරව පාර්ලිමේන්තුව විසින් 2026.03.17 තනතුරට අදාළ වන පරිදි අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. (අංක 2504/07 හා 2026.09.01 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඇතුළත් දීමනා වේ.)

4. **බඳවා ගැනීමේ ක්‍රමය :-** 100% විවෘත පදනමින් බඳවා ගැනේ.

4.1 ලිඛිත විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සමන්විත වේ.

4.1.1 ලිඛිත විභාගය -:

ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර 2 කින් සමන්විත වේ. විභාගය කොළඹ දී පවත්වනු ලැබේ.

| *විෂයය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම | පැය 1 1/2 | 100 | 40 |
| අභියෝග්‍යතාවය | පැය 1 1/2 | 100 | 40 |

විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සාමාජයීය සංස්කෘතික හා ආර්ථික පරිසරය සහ අධ්‍යාපන ක්‍රමය ඇතුළුව අපේක්ෂකයා ජීවත්වන සහ වැඩ කරන පරිසරය. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන කාලීන සිදුවීම් පිළිබඳ ඔහුගේ ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
| අභියෝග්‍යතාවය | අපේක්ෂකයාගේ තර්කන ශක්තිය මැනීම පිණිස සකසන ලද ප්‍රශ්න පත්‍රයකි. |

විභාගය පවත්වනු ලබන මාධ්‍ය:

- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි.
- අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතු ය. එම භාෂා මාධ්‍ය තනතුරට බඳවා ගැනීමේ භාෂා මාධ්‍ය වේ. (අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර නැත.).
- සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතු ය.

4.1.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය -

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | 60 |
| වෘත්තීය දැනුම | 20 | |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | 20 | |
| සේවා පළපුරුද්ද | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය | 30 | |
| | 100 | |

*සටහන :* (i.) ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබූවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා වූ අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා එම ප්‍රමාණයෙන් 50% ක ප්‍රමාණය යන දෙකෙහි එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු සංඛ්‍යාව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ.

(ii.) බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී ඉහත වගුවේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

(iii.) ලිඛිත පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබාගත් ලකුණුවල එකතුවෙහි ඉහළම කුසලතාවය දක්වන අයදුම්කරුවන් පුරප්පාඩු ගණන අනුව තෝරා ගනු ලැබේ.

**5. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :-**

(i.) මෙම පත්වීම අංක 2504/07 හා 2026.09.01 දිනැති *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට යටත් වේ.

(ii.) මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාර අරමුදල් ප්‍රතිලාභ හිමිය.

(iii.) මෙම පත්වීම අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වේ.

(iv.) තනතුරට බඳවා ගෙන වසර 3 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

(v.) පරිවාස කාලය අවසානයේ වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක වීම හා කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සළකා බලා සේවය ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

(vi.) කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙනු ලබන කාර්ය සාධන ඇගයීම් දර්ශක අනුව වාර්ෂිකව ඔබගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරේ. ඒ අනුව ඉදිරි වැටුප් වර්ධක ලබා දීම සිදුකරන අතර උසස් වීම් සඳහාද එම කාර්ය සාධනය උපයෝගී කරනු ලැබේ.

(vii.) රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(viii.) 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත, අංක 2504/07 හා 2026.09.01 දිනැති *ගැසට්* නිවේදයෙහි ඇතුළත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා රීති, ආයතන සංග්‍රහය II, මුදල් රෙගුලාසි හා වරින්වර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පනවනු ලබන රීතිවලට සහ චක්‍රලේඛවලට මෙම පත්වීම යටත්ය.

(ix.) විභාගය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයා කැමති එක් භාෂා මාධ්‍යකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතු ය.

(x.) ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-**

(i.) ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

(ii.) ලිඛිත /ව්‍යුහගත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(a) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(b) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(c) වලංගු රියදුරු බලපත්‍රය.

**7. විභාග ගාස්තු :-** විභාග ගාස්තුව රු.1,000.00 කි. එම ගාස්තුව ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ගිණුම් අංක 7040057 ට බැර වන සේ ගෙවිය යුතු ය. ගෙවනු ලබන විභාග ගාස්තුව කවර හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා රිසිට් පත මෙම අයදුම් පත්‍රයේ ඇලවිය යුතු අතර එහි ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු වේ.

**8. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය.**

(i.) අයදුම්පත්, අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, තැ.පෙ.1431, 36, මලලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනය සඳහන් කර 2026.11.16 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii.) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක **ඉංග්‍රීසි** භාෂාවෙන් පමණක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

(iii.) අයදුම්පත් බහා එවන ලිපි කවරය ඉහළ වම් කෙළවරේ "කාර්යාල කාර්ය සහයක III ශ්‍රේණියට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iv.) අයදුම්පත්‍රයෙහි අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්වයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.71,240/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන, නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v.) අයදුම්පත් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදු විය හැකි ප්‍රතිවිපාක තමන් විසින්ම විඳ දරාගත යුතු ය.

(vi.) අයදුම්පත්‍රය සමග පහත ලේඛනවල සහතික කරන ලද එක් ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය.
- (අ) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත.
- (ආ) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත.
- (ඇ) ඉහත ඉල්ලුම්කර ඇති මූලික සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත්.
- (ඈ) චරිතය පිළිබඳව සඳහන් වන මෑතකදී ලබා ගත් චරිත සහතික 2 ක සහතික කළ පිටපත්.
- (ඉ) විභාග ගාස්තු ගෙවන ලද බව සනාථ කෙරෙන ලේඛනය.

*සටහන :* සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථ කර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**9. සාවද්‍ය තොරතුරු සැපයීම.**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. **පුරප්පාඩු පිරවීම / නොපිරවීම පිළිබඳ අවසාන තීරණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වේ.**

**11. බඳවා ගැනීම් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.**

12. **මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ආර්.එස්.ඒ.දිසානායක,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 ඔක්තෝබර් මස 13 වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
තැ.පෙ. 1431,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

| |
|---|
| |

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
**විවෘත පදනම මත කාර්යාල කාර්ය සහයක III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ අයදුම්පත - 2026**

මාධ්‍ය

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

(අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතු ය)

| | | |
|---|---|---|
| 1.0 | 1.1. සම්පූර්ණ නම | |
| | 1.2. සම්පූර්ණ නම (සිංහල / දෙමළ) | |
| | 1.3. මුලකුරු සමග නම | |
| 2.0 | 2.1. ස්ථිර ලිපිනය | |
| | 2.2 ලිපි යොමුකළ යුතු ලිපිනය | |
| | 2.3. දිස්ත්‍රික්කය | |
| | 2.4. පළාත | |

| | | |
|---|---|---|
| 3.0 | 3.1. ස්ත්‍රී/ පුරුෂ භාවය | |
| | 3.2. ජාතික හැඳුනුම්පත් අංකය | |
| 4.0 | 4.1. ජංගම දුරකතන අංකය සහ whatsapp අංකය | |
| | 4.2. ස්ථාවර දුරකතන අංකය | |
| | 4.3. විද්‍යුත් තැපෑල | |
| 5.0 | 5.1. උපන් දිනය | |
| | 5.2. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස | අවු: මාස: දින: |
| 6.0 | විවාහක / අවිවාහක බව | |
| 7.0 | ජාතිය | |
| 8.0 | ආගම | |

9.0 *අධ්‍යාපන සුදුසුකම්: භාෂා මාධ්‍ය:* ..............................................................

| අ.පො.ස. (සාමාන්‍ය පෙළ) වර්ෂය : .............................. | | විභාග අංකය : .......................................... | |
|---|---|---|---|
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10.0 *වෘත්තීය සුදුසුකම් :-*

...........................................................................................................................................
...........................................................................................................................................
...........................................................................................................................................
...........................................................................................................................................

11.0 *සේවා පළපුරුද්ද:-*

| *ආයතනය* | *කාලය (අවුරුදු ගණන)* |
|---|---|
| | |
| | |
| | |

12.0 *අතිරේක අධ්‍යාපන සුදුසුකම් (බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකමට පරිබාහිර වූ අධ්‍යාපන සුදුසුකම්):*

| *විභාගයේ නම* | *පාසල/ ආයතනය* | *ප්‍රතිඵල* |
|---|---|---|
| උදා : අ.පො.ස. උසස් පෙළ විභාගය | | |
| | | |
| | | |

13.0 විෂය බාහිර ක්‍රියාකාරකම් :-
……………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………

14.0 වෙනත් සුදුසුකම් :-
……………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………

15.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

ඔව් නම් විස්තරය සඳහන් කරන්න ……………………………………………………………………………………
……………………………………………………………………………………………………………………

**16.0** ***විභාග ගාස්තු ගෙවූ රිසිට් පත පිළිබඳ විස්තර :-***
ගෙවන ලද මුදල ………………………… දිනය ………………………
(රිසිට් පත නොගැලවෙන සේ මෙහි අලවන්න)

17.0 අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ ප්‍රකාශය:

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් වැරදි හෝ සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව හෝ හෙලිවුවහොත් මාගේ අපේක්ෂකත්වය/ හෝ පත්වීම අවලංගු කිරීමේ අයිතිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු බව දනිමි.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් පවතින නීති රීතිවලට බැඳී සිටීමට හා නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගිය හොත් බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව මාගේ අපේක්ෂකත්වය/ හෝ පත්වීම අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට යටත් වන බවට මම එකඟ වෙමි.

.........................................................,
අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

දිනය:…………………………………...

**18.** ***අත්සන සහතික කිරීම :***
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, .......................................... දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බව මෙයින් සහතික කරමි.

...................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.
සහ නිල මුද්‍රාව.

අත්සන සහතික කරන නිලධාරියාගේ
සම්පූර්ණ නම :-...........................................................................................
තනතුර :-...........................................................................................
ලිපිනය :-...........................................................................................
දිනය :-...........................................................................................

10 - 656/2

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

2026 ජූලි මස 31 දිනැති අංක 2,500 දරන *ගැසට් පත්‍රයේ* සහ 2026.08.28 දිනැති අංක 2504 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

I. ඉහත *ගැසට්* නිවේදනයේ අංක 7(ඇ) වයස සම්බන්ධ ඡේදය පහත පරිදි සංශෝධනය වේ.

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස අවුරුදු 40 වේ. (රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතු ය.)

II. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.10.23 දක්වා දීර්ඝ කෙරේ. ඉහත *ගැසට් නිවේදනයේ* සඳහන් අනෙකුත් සියලුම කරුණු එලෙසම බල පවත්නා අතර සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනය ද 2026.08.31 දින ලෙස නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 15 වැනි දින,
මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
කොළඹ 01.

10 - 690

---

**ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

2026 සැප්තැම්බර් මස 04 දිනැති අංක 2505 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ශ්‍රී ලංකා විදේශ සේවයේ **III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026 " නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

I. ඉහත *ගැසට්* නිවේදනයේ අංක 04 වයස සම්බන්ධ ඡේදය පහත පරිදි සංශෝධනය වේ.

2026.10.06 දිනට වයස අවුරුදු විසි දෙකට (22) නොඅඩු විය යුතු අතර, අවුරුදු තිස් පහට (35) නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2004.10.06 දින හෝ ඊට පෙර හා 1991.10.06 දින හෝ ඊට පසුව උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

දැනටමත් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකුනම්, ඔහු/ ඇය වයස අවුරුදු 40ට නොවැඩි විය යුතු අතර (ඒ අනුව 1986.10.06 දිනට හේ ඊට පසු උපන්දිනය යෙදී ඇති අය පමණක්), සතුටුදායක සේවා වාර්තාවක් ද ලබා සිටිය යුතු ය.

II. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.10.30 දක්වා දීර්ඝ කෙරේ. අයදුම්පත් භාර ගැනීම 2026 ඔක්තෝබර් මස 19 වැනි දින පෙ. ව. 9.00 ට විවෘත වන අතර 2026 ඔක්තෝබර් මස 30 වැනි දින ප. ව. 9.00ට අවසන් වේ. ඉහත *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් සියලුම කරුණු එලෙසම බල පවත්නා අතර සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනය ද 2026.10.06 දින ලෙස නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 16 දින,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය.

10 - 717

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.